නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

මූලික කාරණා අන්තර්ගත ලේඛනය

- **NEOS Biz**

වර්ගීකරණය : පොදු

Classification: Public

මූලික කාරණා අන්තර්ගත ලේඛනය - NEOS Biz

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සහ මූලික අවදානම්	ප්‍රධාන නියම හා කොන්දේසි
NEOS Biz සේවය	1. භාවිත කරන්නන්ට 360 ගෘහස්ථ තිරය හරහා ගිණුම් ශේෂ, ණය කාඩ්පත් ශේෂ, ස්ථාවර තැන්පත් ශේෂ, ණය ශේෂ සහ කල්බදු ශේෂ ආදිය බලාගත හැකි වීම. 2. මෑත කාලීන ගනුදෙනු 10 බැලීමට හැකිවීම 3. NEOS කටයුතු මගින් NEOS BIZ ජංගම යෙදුම (app) හරහා කරන ලද සියලු ගනුදෙනු විමසීමට ගනුදෙනුකරුට සහාය වේ. විස්තර තනි වාර්තා ලෙස ප්‍රදර්ශනය කරයි. 4. ඇතුළත් කරන්නන් සහ බලය ලබා දෙන්නන් ඇතුළත් කළ හැකි	කරුණාකර NDB බැංකුවේ ආයතනික වෙබ් අඩවියෙහි "බාගත කිරීම්" අංශයේ උඩුගත කරන ලද "ගාස්තු" පත්‍රිකාව බලන්න.	• ශාඛාවට පැමිණ NEOS Biz ලියාපදිංචි කිරීමේ ආකෘතිපත්‍රය, ව්‍යාපාර ලියාපදිංචි කිරීම සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය ඉදිරිපත් කිරීම මගින් දැනට සිටින හෝ අලුත් ගනුදෙනුකරුවන්ට NEOS Biz සඳහා ලියාපදිංචි විය හැකිය.	1. මෙම සේවාව තනි පුද්ගලයන් සහ ආයතන ගනුදෙනුකරුවන් වෙත ප්‍රදානය කරනු ලැබේ. 2. ගනුදෙනුකරු විසින් යෙදුමට ප්‍රවේශ වීමට ඒ සඳහා වෙන් නම් කරන ලද උපකරණ පවත්වාගෙන යාම සහ ආරක්ෂිත ක්‍රම භාවිත කිරීම කරනු ලැබිය යුතුය. 3. ගනුදෙනුකරු විසින් සේවාව/(සේවාවන්) වෙත ප්‍රවේශ වීම සඳහා බැංකුවට දැනුම් දී ඇති ඔහුගේ/ ඇයගේ ජංගම දුරකතන අංකය (නම් කරන ලද ජංගම දුරකතනය) භාවිත කරනු ලැබිය යුතුය. 4. බැංකුව විසින් මේ නියම සහ කොන්දේසිවලට අනුකූලව ජංගම බැංකුකරණ සේවාව (App) භාවිත කිරීම සඳහා අනන්‍ය නොවන අයිතියක් ගනුදෙනුකරු වෙත ප්‍රදානය කරනු ලබයි.

	වීම නිසා NEOS BIZ සේවාව (යෙදුම-app) තුළින් ගනුදෙනු අනුමත කිරීම් කළමනාකරණය කිරීමට හැකිවීම. 5. සේවානියුක්තයන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීමේ සහ සේවානියුක්තයන්ට ආදාල ගෙවීම් සිදු කිරීමේ හැකියාව. 6. සැපයුම්කරුවන් වෙත කරන ගෙවීම් පාලනය කිරීමේ පහසුව. 7. බිල්පත්කරුවන් කළමනාකරණය කිරීමට හැකිවීම. 8. වරකට සේවානියුක්තයන් 50 ක් දක්වා සමූහ වැටුප් ගෙවීමට හැකිවීම. 9. තනි සහ බහු බිල් ගෙවීම්- භාවිත කරන්නන් විසින් සමූහ බිල් ගෙවීම් සඳහා වරකට බිල්පත්කරුවන් 10 දෙනෙකු දක්වා තේරීමට හැකි වීම. 10. තනි සහ සමූහ මුදල් පැවරීම්- භාවිතකරන්නන් විසින් සමූහ මුදල් පැවරීම් සඳහා වරකට බිල්පත්කරුවන් 10 දෙනෙකු දක්වා තේරිය හැකි වීම.		**මූලික අවදානම්** • අනවසර පාර්ශ්වයන් අතට පත් වූ මුරපද හෝ ජීව දත්ත හේතුවෙන් භාවිතකරන්නන්ගේ ගිණුම්වලට හෝ පෞද්ගලික තොරතුරුවලට අනවසරයෙන් ප්‍රවේශවීමේ අවදානමකට භාවිතකරුවන් පත් විය හැකිය. • මුරපද හෝ ජීවදත්ත, හවුලේ භාවිත කරන උපාංගවල ගබඩා කිරීම මගින් අනවසර ප්‍රවේශයන් සිදු විය හැකිය.	5. ගනුදෙනුකරු විසින් නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර යම් වැරදි පිළිබඳව බැංකුවට ක්ෂණිකව දැනුම් දිය යුතුය. 6. බලයලත් භාවිතකරන්නන්ට SMS (කෙටි පණිවුඩ) මගින් මුරපද සන්නිවේදනය කරනු ලබයි. 7. ප්‍රවේශවීමේ ක්‍රමවලට මුරපදය හෝ ජීවදත්ත ඇතුළත් වේ. 8. සියලු ගනුදෙනු සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකීම භාරගනු ලබයි. 9. ගනුදෙනුකරු නිතර මුරපද වෙනස් කළ යුතු මෙන්ම ඒ මුරපද රහසිගතව තබාගත යුතු ය. 10. ගනුදෙනුකරු විසින් ගනුදෙනුකරුගේ ජංගම දුරකතන අංකය නැතිවීමක් හෝ සොරකම් කිරීමක් සම්බන්ධයෙන් +9411244888 අංකය හරහා NDB ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීම මගින් ඒ පිළිබඳව කඩිනමින් බැංකුව වෙත දැනුම් දෙනු ලැබිය යුතුය. 11. බැංකුව විසින් ගනුදෙනු සම්බන්ධයෙන් ගාස්තු අයකිරීමේ අයිතිය තමාවෙත තබාගනු ලැබේ. 12. ගනුදෙනුකරු විසින් බැංකුවට දැනුම්දීම මගින් මෙම සේවාවෙන් ඉවත්විය හැකිය. 13. බැංකුව විසින් තම අභිමතය අනුව සේවාව අහෝසි කිරීම හෝ ඉවත්කර ගැනීම කල හැකිය.

	11. වෙලඳ QR ගෙවීම්. 12. ණය කාඩ්පත් ගෙවා නිරාකරණය කිරීම්. 13. බැංකුවේ ඉල්ලීම් ලැබීම සහ බැංකුව සමග ඉල්ලීම් ආරම්භ කිරීම සඳහා වන අභ්‍යන්තර (inbox)/ බාහිර (outbox) විශේෂාංගය පැවතීම.		• අනවසර ප්‍රවේශය හෝ ආරක්ෂාව බිඳවැටීම් කඩිනමින් වාර්තා කිරීමට අපොහොසත්වීම, මූල්‍ය හානි හෝ අනන්‍යතාවය සොරකම් කිරීමට හේතු විය හැකිය.	14. භාවිතකරුවන් විසින් පළමු ප්‍රවේශයේදීම අදාල නියම සහ කොන්දේසිවලට කැමැත්ත පළකර සිටියි. 15. ගනුදෙනුකරු විසින් අදාලවන සියලු නීති සහ නියෝගවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතුය. 16. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර NDB බැංකුවේ ආයතනික වෙබ් අඩවියෙහි "බාගත කිරීම්" අංශයේ " NDB NEOS BIZ" යටතේ ඇති නියම සහ කොන්දේසි කියවා බලන්න.

ඔබගේ පසුවිපරම අප සමග හුවමාරු කරගන්න

සියලු අවස්ථාවලදී ඔබ සෑහීමට පත්වන ආකාරයට ඔබවෙත අපගේ සේවා සැපයීම සඳහා අප ඇපකැපවී සිටින්නෙමු.

අප විසින් ඔබගේ අපේක්ෂාවන් කොතරම් හොඳින් ඉටුකර ඇද්ද යන්න පිළිබඳව දැනගැනීම සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී දියුණු කරගතයුතු කරුණු පිළිබඳව දැනුවත්වීම සඳහා ඔබගේ පසුවිපරම අප හට උපකාරීවනු ඇත.

ඔබගේ පසුවිපරම හුවමාරු කරගත යුතු ආකාරය:

ඔබට ඔබගේ ශාඛා කළමනාකරු හෝ ඔබගේ සම්බන්ධතා කළමනාකරු හා සම්බන්ධ විය හැකි ය.

අංක. +94(1) 11 2448888 දරන පැය 24 පුරා ක්‍රියාත්මකවන ඇමතුම් මධ්‍යස්ථාන අංකය අමතා සම්බන්ධ විය හැකිය.

අප වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න:- contact@ndbbank.com

ලිඛිතව ඉදිරිපත් කරන්න:- කළමනාකරු, ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකාර අංශය, නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී අංක. 40 නවම් මාවත, කොළඹ 02

පැමිණිලි කිරීමේ කාර්ය පටිපාටිය

පැමිණිල්ලක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, ගනුදෙනුකරු විසින් බැංකු ශාඛාව වෙත පැමිණ අදාල බැංකු ශාඛාවේ සම්බන්ධතා කළමනාකරු හෝ ණය නිලධරයා සම්බන්ධ කරගැනීම හෝ 0112448888 අංකයෙන් NDB ඇමතුම් මධ්‍යස්ථානය ඍජුව සම්බන්ධ කරගැනීම කළ හැකි ය.

අප විසින් ප්‍රතිචාර දක්වන ආකාරය;

පැමිණිල්ල ලැබීමෙන් පසුව, අප විසින් එය බැංකුවේ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ පද්ධතියෙහි වාර්තාකර එම ගැටලුව වහාම විසඳීම සඳහා උත්සාහ කරන්නෙමු. අපට එසේ ක්‍රියාකිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අප විසින් ඔබ වෙත වැඩකරන දින තුනක් ඇතුලත විසඳුමක් ලබා දෙන්නෙමු. පැමිණිල්ලේ ස්වභාවය අනුව මෙම කාලසීමාව තුලදී මෙම ගැටලුව විසඳීමට අපට නොහැකි වුවහොත්, අප විසින් ඔබවෙත ප්‍රතිචාර දක්වනු ලබන ඇස්තමේන්තුගත කාලය පිළිබඳව ඔබව දැනුවත් කරන්නෙමු.

ඔබගේ ගැටළුවට අපෙන් ලැබුණු පිළිතුර පිළිබඳව ඔබ කිසිසේත් සෑහීමට පත් නොවන්නේ නම්, ඔබට ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය හෝ ශ්‍රී ලංකා මහා බැංකුවේ මූල්‍ය පාරිභෝගික සම්බන්ධතා අංශය (FCRD) අමතා සම්බන්ධ විය හැකිය.

ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය (Office of The Financial Ombudsman - SL)
සන්දයානි විජේසිංහ මිය
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය, නො. 01, බෙනෙස්දා පෙදෙස , මිලාගිරිය, කොළඹ 05.
කාර්යාල දුරකථන අංකය: +94 11 259 5624 ටෙලි/ෆැක්ස්: +94 11 259 5625
විද්‍යුත් තැපෑල: fosril@sltnet.lk වෙබ් අඩවිය: www.financialombudsman.lk

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව (CBSL - FCRD)
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ - 01.
විමසීම් සඳහා ක්ෂණික ඇමතුම් (Hotline): 1935
දුරකථන: +94 112 477 966 ෆැක්ස්: +94 112 477 744
විද්‍යුත් තැපෑල: fcrd@cbsl.lk

Classification: Public